වසරින් වසර මෙල්බර්න් නුවර අපගේ කලා කටයුතු අළුත් මුහුණුවරක් ගනියි. ඒ දවසින් දවස අපගේ කලා අංශයන්ට එක්වන නැටුම් අංග නියයි. 2012 වසර එළඹෙන්න රහසායියට ඇතුන්නට ලැබුණ එක් සතුටුදායක ආරංචියක් නම් මාර්තු මාසේදීත් ප්‍රදේශයේ කීර්තන් සෙන්ටර් රංගා ශාලාවේ දී පැවැත්වීමට සැරසෙන නර්ථන ප්‍රසංගය විමසිලිදව ආරංචියයි. රංගන හා උදුම්බරා නර්ථන කණ්ඩායම ඉදිරිපත් කරන "රංගාභිෂේක 3" ප්‍රසංගය මෙවර වෙනත් මුහුණුවරකින් ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇති බව දැනගැනීමට ලැබුණේත් රංගන හා උදුම්බරා දෙපළ "සන්නස"

හැටේ දශකයේ පටන් සිංහල නාට්‍ය ක්ෂේත්‍රයේ දැවැන්ත චරිතයක් වූ එස්. කරුණාරත්න ප්‍රවීණ වේදිකා නාට්‍ය වේදියාණන්ගේ දියණිය වූ උදුම්බරා "සන්නස" වෙනුවෙන් අයගේ අතීතයට යමින් ....

"ඇත්තට ම කුඩා අවධියේ ඉඳන්ම මගේ ලේ වලට කලාව කියන දේ කැවිලයි තිබුණාය කිව්වොත් හිවැරදියි. මගේ පියාණන් එදා ඉඳන් මේ වන තුරුම ක්‍රියාකාරීව සම්බන්ධ වෙනවා. මගේ මව සංගීතාචාර්යවරියක්. ඉතින් ඔය පරිසරය යටතේ මම බහ තෝරන වයසේදී මාව නර්ථනයට තමයි ඒ අය යොමු කළේ. මටත් ඒ ආසාව තිබුණා. මුලින් ම අඩිය තියාගන්න පුළුවන් කාලයේ ඉඳන් තිබුණ ඒ හැකියාව අදටත් දිගටම පෙන්වමින් කටයුතු කරන්න ලැබීම වාසනාවක්. අපේ දරුවන්ට මම මේ ශිල්පය ලබාදෙන්න හරිම සතුටින්..."

"අද වෙන කොට විශ්වයට අපේ නර්ථනය හඳුන්වා දෙමින්, සුදු දරුවන්ට පවා ශිල්පය දෙමින් මෙල්බර්න් විශ්ව විද්‍යාලයේ වික්ටෝරියන් කොලේජ් ඔෆ් දි ආර්ට්ස් හි (Victorian College of the Aft) නර්ථන අංශයේ බාහිර කථිකාචාර්යවරියක් විදියට කටයුතු කරනවා. මේ අපේ ශ්‍රී ලංකාවේ නර්ථනය විදේශික විශ්ව විද්‍යාලයක ඉගැන්වෙන ප්‍රථම අවස්ථාව. චිත්‍රසේන වගේ ප්‍රවීණයින් ප්‍රසංග පවත්වා තිබුණත් අධ්‍යන අංශයෙන් මේ ශිල්පය අවුරුදු නවයක් පුරා ඉදිරියට ගෙන යන්නට මුලින්ම මට අවස්ථාව ලැබීම ගැන මම ඉතා සුටු වෙනවා."

"2003 පෙබරවාරි මාසෙ, විදේශීය ශිෂ්‍යයන් හැටියටයි රංගනත් මෙත් මේ රටට ආවෙ. ඒ ආවෙ අපේ පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා. මම ලංකාවේ සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ නර්ථන උපාධිධාරිනියක්. රංගන ජේරාදෙණි විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී උපාධිධරයෙක්. ඔහු ලංකාවේ ගීතිඥ වෘත්තිකයෙක්. මම කොළඹ විශ්ව විද්‍යාලයේ ප්‍රසාංගික කලා කථිකාචාර්යවරියක් විදියටයි රැකියාව කළේ."

"මම ඔය කාලෙ වෙනකොට දකුණු ඉන්දියාවේ " භරත නාට්‍යම් නර්ථන සම්ප්‍රදය" ඉන්දියාවේ හාත් ඛණ්ඩයේ විශ්ව විද්‍යාලය තුළ අවුරුදු හතරක උපාධියක් සම්පූර්ණ කරලා ඒ පිළිබඳව

සාකච්ඡා කළේ
සිසිර දිසානායක

විශාරද තත්ත්වය ලබලයි හිටියේ. ඉන්දීය සම්ප්‍රදායානුකූල නර්ථන ශිල්පයට අයිති කතක්, කතකලි, මනිපුරි, භරත, ඔඩිසි, කුච්චිපුඩි, මෝහිනී ආට්ටම් කියන සම්ප්‍රදය හතෙන් භරත සම්ප්‍රදයයි මම ප්‍රගුණ කළේ. අවුරුදු දෙකක් ඉන්දියාවෙදි හදාරලා ඊට පස්සෙයි ලංකාවේදි ඒ ඉන්දියානු විභාග වලට පෙනී සිටිමින් විශාරද තත්ත්වයේ විභාග සම්පූර්ණ කළේ. ඒ ශිල්පය හදාරලා මගේ අරංගේත්‍රම් උත්සවය කළා වගේම මගේ මුල්ම ශිෂ්‍යාවගේ අරංගේත්‍රම් උත්සවයත් ලංකාවෙන් එන්න කලින් කරලා එන්න මට වාසනාව ලැබුණ එක සතුටක්. අරංගේත්‍රම් කියලා කියන්නේ මේ ශිල්පය හදාරපු කෙනෙක් ශිල්පියෙක් හැටියට දෙරට වඩින උත්සවය. ඒ කියන්නේ ඒ ශිල්පියගේ ප්‍රථම ශිල්පීය ඉදිරිපත් කිරීමයි."

"ඉතින් ඔය දේවල් කළේ ත්‍රස්තවාදී කලබල වලට විශ්ව විද්‍යාල වහල තිබුණ කාලෙ. ඉතින් ඔය වගේම මම අතික් නැටුම් සම්ප්‍රදයවල් ප්‍රගුණ කළා. මිරැන්ඩා හේමලතා, වාසුගී ආන්මුගම් පිල්ලේ වාගේ ආචාර්යවරුන් මගේ භරත නාට්‍යම් ශිල්පීය කුසලතා ඔපමට්ටම් කළා. ඒ වගේම තිස්ස කාරියවසම්, මුදියන්සේ දිසානායක, පියසාර ශිල්පාධිපති, ආරියරත්න කළුආරච්චි වැනි ආචාර්ය මණ්ඩලයකින් තමයි විශ්ව විද්‍යාලයේදි ශිල්ප හැදෑරුවේ. රංගනත් නිතීඥයෙක් වෙන්න ඕන කරන අධ්‍යාපනික කටයුතු කළේ ඔය කියන කාලයේදීමයි."

"අපිට මේ රටට එන්න ලැබුණේ ශාස්ත්‍රවේදී උපාධි හදාරන්න ජනාධිපති ශිෂ්‍යත්ව ලැබිලයි. මගේ ශාස්ත්‍රවේදි උපාධිය වුනේ "රංගන විනයාසය" යි. රංගනට ලැබුණේ ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ ශාස්ත්‍ර උපාධිය හදාරන්න ශිෂ්‍යත්වයක්. ඔහු ඒ උපාධිය හැදෑරුවේ ඩබ්ලින් විශ්ව විද්‍යාලයේ. ඔහු වික්ටෝරියා විශ්ව විද්‍යාලයේ වෘත්තීය ගණකාධිකරණය පිළිබඳව උපාධියකුත් කළා. ඔහු ජාතික ඕස්ට්‍රේලියානු බැංකුවට දත්ත

සපයන්නකු විදියටයි මුලින්ම ඇතුලත් වුණේ. දැන් ඔහු ඒ බැංකුවේ ක්ලේටන් ශාඛාවේ කළමණාකරුවෙක් විදියට වසර තුන හමාරක කාලයක් තිස්සේ සේවය කරනවා. "

මෙලෙස්ත් සිය අධ්‍යාපන හා වෘත්තීය ඉළක්කයන් වෙත ළඟා වූ රංගන හා උදුම්බරා සුවඳ අපගේ උප සමාජ සංස්කෘතියට සිය ශිල්ප දයකත්වය දායාද කිරීමට පෙළඹුණ අන්දම පිළිබඳව අනතුරුව අපි යොමු වූයෙමු.

"අපි ආව මුල් දවස්වල හිටපු අසල්වැසි විදේශික සුවලකගෙන් අපි ගුවන් විදුලි යන්ත්‍රයක් ඉල්ලා ගත්තා අපේ සිංහල වැඩ සටහන් ප්‍රචාරය වෙන බව දැනගන්න ලැබුණට පස්සේ. අපිට මුලින් ම අහන්න ලැබුණේ මාලනී ජයසිංහ මහත්මියගේ හඬ. ඇය ඒ වෙලාවෙ ආරාධනා කළේ ඒ දවස්වල මෙහි පැමිණ සිටි බේමා නම් වූ අපේ ප්‍රවීණ නර්ථන ශිල්පිනිය ඩැංඩිනොං ආර්ට් සෙන්ටර් එකේ පවත්වන වැඩමුළුවට සම්බන්ධ වෙන්න කියලයි. ඇත්තටම ඒක අපිට හොඳ ආරංචියක් වුණා."

"එදා තමයි අපිට ජය ශ්‍රී චන්ද්‍රජිත්, වරුන සාවින්ද්‍ර, ප්‍රසන්න කුරුකුලරත්න, රෝහණ කරුණාරත්න වාගේ පිරිසක් මුණ ගැහුණෙ. බේමා ශිල්පිනිය අපි ලංකාවෙ ඉඳන්ම දැනගෙන හිටපු නිසා ඒ කටයුතු වලට අපිව පහසුවෙන්ම දයක කරගත්තා. ඒ වගේම රංගනගේ මව නන්ද රත්නතුංග කියන රංගවේදිනියව, මගේ පියාව ජය ශ්‍රී කලාකරුවා දැනගෙන හිටියා. ඉතින් ඔය දැන හැඳුනුම්කම් එක්ක අපේ මේ රටේ මේ ගමනට යොමු වුණා. ඉතින් ඒ අයගේ ඉල්ලීම, දිරිගැන්වීම උඩ තමයි අපි නැටුම් පන්ති පටන් ගත්තෙ. ඊට මාස දෙක තුනකට කලින් රසිකා කුලසිංහ මහත්මියත් පන්තියක් පටන් අරගෙන තිබුණා. ඊට අමතරව නිමිතා රූපසිංහලා, ජයවර්ධන සොහොයුරියෝ වගේ කුඩා කණ්ඩායම් තමන්ම නිර්මාණය කරගත් දේවල් කරමින් හිටියා."

"ඉතින් මාලනී ජයසිංහ මහත්මියගේ ආරාධනය පිට, ආධාරය පිට තමයි අපි පන්ති පටන්ගත්තේ. දයා උඩවෙල මහත්මයා තමයි අපිට බෙරයක් පවා හොයලා ගෙනත් දුන්නෙ."

රංගනද අප හා එක්වෙමින් සිය අතීතාවර්ජනයක යෙදුනේය.

"මගේ මව නර්ථනාචාර්යවරියක්. ඩී. එස්. සේනානායක විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ නැටුම් ගුරුවරියයි ඇය. මම ඉගෙන ගත්තෙත් ඒ විද්‍යාලයේමයි. ඉතින් කුඩා කාලයේ ඉඳන්ම ඒ හැකියාවත්, හුරුවත් මට ලැබුණා. ද්විතීක අධ්‍යාපනයේදී නන්දන බාලසූරිය ගුරුතුමාගෙනුයි නැටුම් ඉගෙනගත්තේ. වෙස් පෑළඳීම දක්වාම නැටුම් හැදෑරුවේ මම එතුමාගෙන්. ඒ වගේම මම කතකලි, කතක් කියන නර්ථන ශිල්ප, බෙර වාදනය එහෙම හැදෑරුවා. මට වෙස් බැන්දේ මහා තෙල්වල ගුරුන්නාන්සේයි. ඒ මට අවුරුදු දසයේදී. කොළඹ ගංගාරාමයේ යි ඒ උත්සවය තිබුණෙ. ඒ වගේම ප්‍රාරම්භ, මධ්‍යම හා අවසාන විභාග සමත් වුණ නිසා ලංකාවේ වුනත් නර්ථනාචාර්යවරයෙක් විදියට රැකියාව කරන්න පුළුවන්. ඒත් මගේ මවට ඕන කළේ මාව සමබර හොඳ පුරවැසියෙක් කරන්න. ඒ නිසා මම විද්‍යා විෂයන් හැදෑරුවා. විශ්ව විද්‍යාල අධ්‍යාපනයට කලින් නීතිය හදෑරුවා. විශ්ව විද්‍යාලයෙන් ගෞරව උපාධියක් සමග පිටවෙලා මානව සම්පත් කළමණාකරුවෙකු විදියට ලංකාවේ රැකියාව කළා."

අනතුරුව අප යොමු වූයේ "රංගාභිෂේක 3 " SPIRIT OF RHYTHMS (ස්පිරිට් ඔෆ් රිදම්ස්) ප්‍රසංගය වෙතයි."

"මුලින් ම සන්දර්ශනයක් කරන්න කලින් ළමයින්ව ඒ තත්ත්වයට ගන්නයි අපට ඕන කළේ. වසර තුනකට පස්සේ 2006 දී මොනෑෂ් විශ්ව විද්‍යාලයේ ඇලෙක්සැන්ඩර් තියටර් එකේ "රංගාභිෂේක 1 " ප්‍රසංගය එළි දැක්වුවා. ඒක බොහෝ අගයීමට ලක් වුණා. ඇත්තමට හෝමාගම ගලවිලවත්තේ හිවසේදීත් කොළඹ සුදර්ශි ශාලාවේදීත් පන්ති පවත්වපු හුරුව මට වැදගත් වුණා. 2008 වසරේ ඕස්ට්‍රේලියානු නර්ථන උළෙලේ අපේ රට නියෝජනය කළා. ආර්ට් සෙන්ටර් එකේ පැවැත්වුණ මේ උත්සවය පළමු වතාවටයි මෙල්බර්න් නුවර පැවැත්වුණේ. 2009 දී අපි "රංගාභිෂේක 2" ඕසන් සෙන්ටර් රඟහලේ

රංගාභිෂේක 3 – ස්පිරිට් ඔෆ් රිදම්ස්

පැවැත්වුවා. වෙනත් නර්ථන පාසැල් දෙකක ම ප්‍රසංග 2011 දී පවත්වපු නිසා අපි "රංගාභිෂේක 3" ප්‍රසංගය 2012 දී පවත්වන්නට සැළසුම් කළා."

"අපි මේ වාරෙ වෙනස්කම් සැහෙන්න කළා. මේ ප්‍රසංග එකින් එක වෙනස් ආකාරයකටයි ඉදිරිපත් කරන්නෙ. මුල්ම ප්‍රසංගයේ දරුවන්ගේ නර්ථන හැකියාවන් ක්‍රම ක්‍රමයෙන් වැඩි දියුණු වන අන්දමට පෙළ ගැන්වුවා. දෙවැනි ප්‍රසංගයේ නර්ථන රංගවේදය අපේ ජන ගීයට අනුව වේදිකාගත කළා. ප්‍රථම භාගය ජන ජීවිතය නිරූපනය කරන අංග පෙළක් පෙළගැන්වුවා. ගොයම් ගී, ප්‍රශස්ති වගේ දේවල් වලින් මේ කතාව ගොඩ නැගුවා. අත් පිටපත් මගේ පියාගේ. සංගීතය තරුපති මුණසිංහයන්ගේ අධ්‍යක්ෂණයේ දී පියාත් සමග ජය ශ්‍රී චන්ද්‍රජිත් කලා කරුවාත් දයක වුණා. දෙවන භාගයේ සාමාන්‍ය නැටුම් අංග ඉදිරිපත් කළේ අනෙක් ළමයින්ටත් ඉඩක් ලබාදෙන්න. පතුරු නැටුම, දුම්මල පදය වාගේ

"අපිත් එන එන හැම දෙයක්ම භාරගන්නෙ නෑ. නමුත් අපට වැටහුණා මේ දෙය හොඳ දෙයක් බව. අපට ඕන වුණා අපේ සම්ප්‍රදායික නැටුම් හදාරපු ළමයින්ට ලෝකයේ වෙනත් සම්ප්‍රදායන්වලට මොනතරම් දුරට යන්න පුළුවන්ද කියන එක පෙන්වන්න. තමන් හදරපු ශෛලිය තුළ තමන්ට මොනතරම් පරාසයකට යන්න පුළුවන්ද කියලා අපේ දරුවන්ගෙන්ම පෙන්වන්නයි මේ උත්සාහය. අපි මේ දේ මීට කලින් සාර්ථකව කරලා තියෙනවා. ඉතින් ඒ සංකල්පය මත පිහිටලා පවත්වන Spirit of Rhythms ප්‍රසංගය සාර්ථකව කරගන්න පුළුවන්ය කියලා අපි තදින්ම විශ්වාස කරනවා. ඉතින් ඒ සාර්ථක බව විඳින්න ඔබ සැමටත් එක්වෙන්න කියලා ආදරයෙන් ආරාධනා කරනවා."

ප්‍රසංගය සාර්ථක වේවා ! යි සන්නස වෙනුවෙන් අපි රංගන හා උදුම්බරා දෙපළට සුභ පැතුවෙමු.

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia